## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# රාජ්‍ය ශිෂ්‍යත්වයක් මගින් ලොව ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය හදාරන්න - 2025 උසස් පෙළ විශිෂ්ටතමයන්හට පිදෙන අගනා ප්‍රදානයක්!



**“පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්"** යන රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අ.පො.ස. (උසස් පෙළ) ඉතා විශිෂ්ට ලෙස සමත් සිසුන් 200 දෙනෙකු බලගැන්වීම සඳහා ඔවුන්ට **කීර්තිමත්, ජාත්‍යන්තරව ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත විදේශීය විශ්වවිද්‍යාලයන්හි ප්‍රථම උපාධිය** හැදෑරීමට අවස්ථාව සැලසීම පිණිස නිර්මාණය කර ඇති මෙම සුවිශේෂ විදේශ ශිෂ්‍යත්ව වැඩසටහන අඛණ්ඩව දෙවන වරටත් ක්‍රියාත්මක කරනු ලබනුයේ මහත් අභිමානයකිනි.

**"ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක්”** බිහිකිරීමෙහි ලා හඳුන්වා දී ඇති මෙම වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය මගින් **2026/2027 අධ්‍යයන වර්ෂය** සඳහා ආසන්න වශයෙන් සිසුන් **25 ත් 50** ත් අතර සංඛ්‍යාවකට රජය විසින් මූල්‍යායනය කරනු ලබන ශිෂ්‍යත්ව අවස්ථා ලබා දෙනු ඇත**. 2025 සිට 2029 දක්වා වසර පහක කාලය** තුළ **මුළු ශිෂ්‍යත්ව 200ක්** ප්‍රදානය කිරීමේ ඉලක්කය ඇතිව, වාර්ෂික පදනමින් ශිෂ්‍යත්වලාභී සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ නංවනු ඇත.

### 1. අයදුම්පත් කැඳවීම:

I. 2025 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵල ලැබූ සිසු සිසුවියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

II. සියලුම අධ්‍යයන ක්ෂේත්‍රවල සිසු සිසුවියෝ අයදුම් කිරීමට සුදුසුකම් ලබති. කෙසේ වෙතත්, ගෝලීය වශයෙන් නැගී එන ක්ෂේත්‍ර සඳහා/ ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල මේ වන විට හැදෑරීමට අවස්ථාව නොමැති ක්ෂේත්‍ර; විශේෂයෙන්ම රටේ ආර්ථික වර්ධනයට සහ තිරසාර සංවර්ධනයට දායක වීමේ විභවතාවක් සහිත ක්ෂේත්‍ර සඳහා අයදුම් කරන අපේක්ෂකයින් වෙත ප්‍රමුඛතාව දක්වනු ඇත.

III. පහත සඳහන් ගෝලීය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් දර්ශක අතුරින් එකක ඉහළම ස්ථාන 500 තුළ ශ්‍රේණිගත කර ඇති ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් සහ තමන් කැමති උපාධි පාඨමාලාවක් හඳුනා ගැනීමට අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

- ✓ **QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් දර්ශකය**
- ✓ **ටයිම්ස් උසස් අධ්‍යාපන (THE) ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් දර්ශකය**
- ✓ **ලෝක විශ්වවිද්‍යාල අධ්‍යයන ශ්‍රේණිගත කිරීම් දර්ශකය (ARWU) - ෂැංහයි ශ්‍රේණිගත කිරීම් දර්ශකය**

## 2. අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය:

**පියවර I:**

අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් කැමති උපාධි පාඨමාලාව **හඳුනාගෙන,** ඉහත සඳහන් කළ පරිදි ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් තෝරා ගැනීම අපේක්ෂා කෙරේ.

**පියවර II:**

පහත දක්වා ඇති පරිදි, **ඔබගේ අයදුම්පත** අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **මාර්ගගත අයදුම්පත් ද්වාරයට යොමුකරන්න.**

I. අපේක්ෂක/අපේක්ෂිකාවන්, https://foreignscholarships.mohe.gov.lk සබැඳිය ඔස්සේ පිවිස අමාත්‍යාංශයේ මාර්ගගත ද්වාරයෙහි (Online Portal) පිවිසුම් ගිණුමක් (Login Account) නිර්මාණය කළ යුතුය.

II. **මාර්ගගත අයදුම්පත සහ වැඩිදුර විස්තර** අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය: www.mohe.gov.lk, www.moe.gov.lk

III. මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය **2026 මැයි 11** වේ.

IV. අවශ්‍ය සියලු විස්තර සමඟ මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.

V. අයදුම්පත් අමාත්‍යාංශයේ මාර්ගගත ද්වාරය හරහා පමණක් යොමු කළ යුතුය. **තැපැල් මගින් එවනු ලබන දෘඪ පිටපත් කිසිවක් භාර ගනු නොලැබේ.**

**පියවර III:**

I. අපේක්ෂක/අපේක්ෂිකාවන් ප්‍රධාන වශයෙන් අධ්‍යයන කුසලතා මත පදනම්ව කෙටි ලැයිස්තුගත (Shortlist) කරනු ඇත. මෙහිදී ජාතික සහ දිස්ත්‍රික් කුසලතා සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

II. කෙටි ලැයිස්තුගත කරනු ලැබූ අපේක්ෂක/අපේක්ෂිකාවන් කෙටි දැනුම්දීමක් මත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ඇත.

**පියවර IV:**

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා ගන්නා සිසු සිසුවියන් හට තමන් තෝරාගත් විශ්වවිද්‍යාලය වෙත අයදුම් කර ප්‍රවේශ අවස්ථාවක් තහවුරු කර ගැනීමට උපදෙස් ලබා දෙනු ඇත.

II. තෝරාගත් විදේශීය විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරනු ලබන **ප්‍රවේශ ලිපිය (Placement Letter)** ඉදිරිපත් කිරීමෙන් සහ **ශිෂ්‍යත්ව ගිවිසුම අත්සන් කිරීමෙන්** අනතුරුව ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ඇත.

**පියවර 1:**
- ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයක් සහ උපාධි පාඨමාලාවක් හඳුනා ගන්න.

**පියවර 2:**
- අමාත්‍යාංශයේ මාර්ගගත අයදුම්පත් ද්වාරය (Online Portal) හරහා අයදුම් කරන්න.

**පියවර 3:**
- සම්මුඛ පරීක්ෂණය:
  * **අමාත්‍යාංශයේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:** ශිෂ්‍යත්ව ප්‍රදානය ලබා දීම පිණිස යෝග්‍යතාව තක්සේරු කිරීම.

**පියවර 4:**
- ශිෂ්‍යත්ව අවස්ථාවක් හිමි කරගැනීම සඳහා ඔබ සුදුසුකම් ලබා ඇත්දැයි පරීක්ෂා කරන්න
- හඳුනාගත් විදේශීය විශ්වවිද්‍යාලය වෙත අයදුම්පත් යොමු කර අදාළ විශ්වවිද්‍යාලය විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රවේශ ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න.
- ප්‍රවේශ ලිපිය (Placement Letter) මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්න.
- ශිෂ්‍යත්ව ගිවිසුම අත්සන් කර ශිෂ්‍යත්ව ප්‍රදානය ලබා ගන්න.

- ඔබේ අධ්‍යයන කටයුතු සාර්ථකව නිම කර අමාත්‍යාංශය වෙත වාර්තා කරන්න.
- දේශය නඟා සිටුවීම පිණිස ඔබේ දැනුම රැගෙන පැමිණෙන්න.

**3. සුදුසුකම් ලැබීමේ මූලික අවශ්‍යතා:**

**අයදුම්කරුවන් පහත සඳහන් සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
II. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ **2025 අ.පො.ස. උසස් පෙළ විභාගයේ** දී සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් **30%** ක ලකුණු ලබා තිබිය යුතුය.
III. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය (අ.පො.ස. උසස් පෙළ විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා අවම වශයෙන් "C" ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබීම හෝ ඊට සමාන සුදුසුකමක්)
IV. අයදුම්පත් භාර ගන්නා දිනයට හෝ ඊට ප්‍රථමව වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබිය යුතුය.
V. මනා සෞඛ්‍ය තත්වයකින් පසුවිය යුතු අතර අධ්‍යයන කාලය තුළ විදේශයක (අදාළ රටේ) ජීවත් වීමට සූදානම්ව සිටිය යුතු වේ.

**4. ශිෂ්‍යත්ව ප්‍රදානයෙන් ආවරණය කරනු ලබන ක්ෂේත්‍ර:**

**4.1 මෙම ප්‍රදානයට මූලික වශයෙන් පහත සඳහන් සංරචක ඇතුළත් වන අතර, උපරිම වශයෙන් වසර හතරක කාලයක් සඳහා අදාළ වේ:**

I. පාඨමාලා ගාස්තු සහ අනෙකුත් අධ්‍යයන ගාස්තු
II. ආහාර සහ නවාතැන් වියදම් සඳහා වන මාසික දීමනාව
III. සෞඛ්‍ය රක්ෂණ දායකත්වය
IV. එක් වරක් යාමට හා ඒමට පිරිමැසුම් පන්තියේ (Economy Class) ගුවන් ගමන් ගාස්තු

**4.2 අවශ්‍යතාවය හා යෝග්‍යතාවය අනුව මෙම ශිෂ්‍යත්වය මගින් පහත සඳහන් සංරචකයන්ද ආවරණය කරනු ලැබිය හැකිය:**

I. වීසා හා අදාළ ගාස්තු
II. එක් වරක් පමණක් ගෙවනු ලබන දීමනාව (උණුසුම් ඇඳුම් දීමනාව, ගුවන් තොටුපලේ සිට අදාළ විශ්වවිද්‍යාලය දක්වා වූ ප්‍රවාහනය සඳහා වන දීමනාව, නවාතැන සඳහා වන මූලික තැන්පතු දීමනාව ආදී )
III. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා විභාග ගාස්තු

**වසරක් සඳහා වන ප්‍රදානයේ සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක (රුපියල් 20,000,000 ක) උපරිමයකට යටත් වේ.** කෙසේ වෙතත්, අපේක්ෂකයාගේ අධ්‍යයන කුසලතා සහ තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය සැලකිල්ලට ගනිමින්, එක් එක් ශිෂ්‍යයාට හිමිවන ප්‍රදාන මුදල අමාත්‍යාංශය විසින් තීරණය කරනු ඇත. ගෝලීය වශයෙන් නැගී එන විෂය ක්ෂේත්‍රයන් හදාරන්නන් වෙත; විශේෂයෙන් රටේ ආර්ථික වර්ධනයට සහ තිරසාර සංවර්ධනය කිරීමෙහි ලා සැළකිය යුතු විභවතාවයක් සහිත ක්ෂේත්‍ර හදාරන්නන් වෙත ප්‍රමුඛතාව හිමි වනු ඇත.

**5. නියමයන් සහ කොන්දේසි:**

I. මෙම යෝජනා ක්‍රමය මඟින් **ප්‍රථම උපාධි හැදෑරීම සඳහා පමණක්** මූල්‍යමය ආධාර ලබා දෙනු ඇත.

II. ප්‍රථම උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අපේක්ෂකයින් නැවත ශ්‍රී ලංකාවට පැමිණිය යුතුය.

III. මෙම යෝජනා ක්‍රමය මගින් උපරිම වශයෙන් අධ්‍යයන වර්ෂ 4ක් දක්වා මූල්‍ය ආධාර සපයනු ලබයි.

IV. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විදේශීය විශ්වවිද්‍යාල තෝරා ගැනීමට අපේක්ෂකයින් දැඩි ලෙස දිරිමත් කරනු ලැබේ. කරුණාකර UGC වෙබ් අඩවිය (https://www.ugc.ac.lk/) පරිශීලනය කරන්න.

V. ශ්‍රී ලංකාවේ වෘත්තිමය ආයතන විසින් පිළිගනු ලබන උපාධි පාඨමාලා තෝරා ගැනීමට අපේක්ෂකයින්හට උපදෙස් දෙනු ලැබේ.

VI. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය හිමි වූ අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කෙරෙන රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය සඳහා සලකා බලනු නොලැබේ.

VII. අපේක්ෂකයින් / අපේක්ෂිකාවන් අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට සහ රටේ ආර්ථික වර්ධනයට සහ තිරසාර සංවර්ධනයට දායක වීමට ඔවුන්ගේ විධිමත් කැමැත්ත ප්‍රකාශ කරමින් මෙම අමාත්‍යාංශය සමඟ ශිෂ්‍යත්ව ගිවිසුමක් අත්සන් කළ යුතු වේ.

VIII. ශිෂ්‍යත්වය, තෝරාගත් උපාධි වැඩසටහනේ නියමිත කාල සීමාව පමණක් ආවරණය කරන අතර එම කාල සීමාවෙන් ඔබ්බට දීර්ඝ කිරීමක් සිදු නොකෙරේ.

IX. **තෝරාගැනීමේ ක්‍රියාවලිය අවසන් වීමෙන් අනතුරුව** ශිෂ්‍යත්ව ප්‍රදානය ප්‍රතික්ෂේප කරනු ලබන ඕනෑම අපේක්ෂකයකු / අපේක්ෂිකාවක මෙම අමාත්‍යාංශය විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන කිසිදු ශිෂ්‍යත්ව අවස්ථාවක් සඳහා සලකා බැලීමට නුසුදුස්සකු වන්නේය.

X. ලිඛිතව හෝ වාචිකව යන ඕනෑම ආකාරයකින් සිදු කෙරෙන බලපෑමක් ශිෂ්‍යත්වයක් සඳහා නුසුදුස්සකු වීමට හේතු වනු ඇත.

XI. අයදුම්පතෙහි සපයා ඇති කිසියම් අසත්‍ය හෝ නොමඟ යවනසුළු තොරතුරක් ක්‍රියාවලියේ ඕනෑම අදියරක දී නුසුදුස්සකු වීමට හේතු විය හැකි අතර ප්‍රදානය අවලංගු කිරීමට සහ ප්‍රදාන මුදල් ආපසු ගෙවීමට සිදු වීමටද හේතු විය හැක.

XII. **මෙම ප්‍රදානය සම්බන්ධයෙන් වන අවසානාත්මක තීරණය ලේකම්වරයා සතුය.**

**ලේකම්**
**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**උසස් අධ්‍යාපන අංශය**
**අංක: 18**
**වෝඩ් පෙදෙස, කොළඹ 07**